අපේ අංකය: සං/ප්‍රති/01
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල.

2003.01.01

වගා දිරි දීමනා
චක්‍රලේඛ අංක : 59

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත,

## තේ නැවත වගාව සහ පාළු සැපයීම යටතේ ගෙවනු ලබන දිරි දීමනා මුදල වැඩි කිරීම

තේ සෙස් අරමුදල් ප්‍රතිපාදන යටතේ පෞද්ගලික ඉඩම් වල තේ නැවත වගාව සහ පාළු සැපයීම සඳහා ගෙවනු ලබන දිරි දීමනා මුදල පහත දැක්වෙන අන්දමට 2003 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇති අතර එය 2002.12.24 දිනැති අංක 1268/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර තිබේ.

(1). **තේ නැවත වගාව**

| | වාරිකය | උඩරට/මැදරට දිස්ත්‍රික්ක හෙක්/ රුපි. | පහතරට දිස්ත්‍රික්ක හෙක්/ රුපි. |
|---|---|---|---|
| i | බිම් සැකසීම | 35,000 | 30,000 |
| ii | පස සාරවත් කිරීම | 25,000 | 22,000 |
| iii | නැවත වගා කිරීම | 100,000 | 98,000 |
| | එකතුව | 160,000 | 150,000 |

(2). **ගෙවීම් පිළිවෙල**

1989.01.18 දිනැති අංක 10 චක්‍රලේඛයේ දැක්වෙන පරිදි සියලුම ගෙවීම් අත්තිකාරම් ක්‍රමයට අනුව අක්කරයක (හෙක්. 0.4047) උපරිම බිම් ප්‍රමාණයක් සඳහා වාරික 5කින් ගෙවිය යුතුය. ඒ අනුව වාරික වැඩ කොටස් නිමකරන බවට වගාකරුගේ එකඟතාවය ලබා ගත යුතුය.

වාරික අනුව ගෙවීම් පිළිවෙල පහත දක්වා ඇත.

| වාරිකය | පරීක්ෂණ අවස්ථාව | වාරික මුදල (හෙක්/රුපි.) උඩරට/මැදරට දිස්ත්‍රික්ක | පහතරට දිස්ත්‍රික්ක |
|---|---|---|---|
| i | උදුරා දැමීම හා පස සංරක්ෂණය නිමකළ පසු | 35,000 | 30,000 |
| ii | තෘණ සිටුවා මාස 6කින් පසුව | 16,000 | 15,000 |
| iii | තෘණ සිටුවා මාස 18කින් පසුව | 74,000 | 72,000 |
| Iv | තේ පැල සිටුවා නැවත වගා කළ පසුව | 20,000 | 18,000 |
| v | නැවත වගා කිරීමෙන් එක් වර්ෂයකට පසුව | 15,000 | 15,000 |
| | එකතුව | 160,000 | 150,000 |

උඩරට/ මැදරට දිස්ත්‍රික්ක : මහනුවර, මාතලේ, නුවරඑළිය සහ බදුල්ල
පහතරට දිස්ත්‍රික්ක : මාතර, ගාල්ල, රත්නපුර, කළුතර, කොළඹ, කෑගල්ල, හම්බන්තොට, කුරුණෑගල සහ මොණරාගල.

(3). <u>පාළු සැපයීම</u>

(i). සියලුම තේ වගා ප්‍රදේශ සඳහා බල පැවැත්වෙන පරිදි පාළු සැපයීම මගින් දළු නෙලන තේ ඉඩම් පුනරුත්ථාපනය කිරීම සඳහා ගෙවනු ලබන දිරිදීමනා මුදල එක් පැලයකට රු.10/-ක් දක්වා වැඩිකර ඇති අතර ගෙවීම් පිළිවෙල පහත දක්වා ඇත.

(ii). මහනුවර, මාතලේ, නුවරඑළිය, බදුල්ල දිස්ත්‍රික්ක සහ රත්නපුර දිස්ත්‍රික්කයේ ඊසානදිග වගා කන්නය අදාල බලංගොඩ ප්‍රදේශය සඳහා උපරිම වශයෙන් හෙක්/පැල 2470 (අක්/පැල 1000) ක් සහ අනෙකුත් සියලු තේ වගා ප්‍රදේශ සඳහා හෙක්/පැල 1850 (අක්/පැල 750) ක් බැගින් ගෙවීම් කළ හැකිය.

ගෙවීම් වාරික පහත දැක්වේ.

| | |
|---|---|
| 1 වන වාරිකය - පාළු පැල සිටුවීම | පැලයකට රු.7.50 |
| 2 වන වාරිකය වර්ෂයක් තුල සිටවූ පාළු පැල නඩත්තු කිරීම | පැලයකට රු.2.50 |

(iii). එක් ඉඩමක් සඳහා පාළු සැපයීමේ දිරි දීමනාව ගෙවීම අක්කරය (හෙක්.0.4047)ක උපරිම බිම් ප්‍රමාණයකට සීමාවේ.

(4). දැනටමත් වලංගුව පවතින ක්‍රියාකාරී සියලු අවසර පත්‍ර සඳහා 2003 ජනවාරි මස 01 වැනි දින හෝ ඉන් පසුව අනුමත කෙරෙන සියලුම ගෙවීම් වාරික නව සංශෝධිත ගෙවීම් ප්‍රමාණ අනුව ගණනය කොට ගෙවීම් කළ යුතුය. සියලුම ගෙවීම් තේ නැවත වගා කිරීමේ සහ පාළු සැපයීමේ ආධාර ක්‍රම යටතේ අනුගමනය කළ යුතු නීතිරීති හා උපදෙස් වලට අනුකූල විය යුතුය.

(5). දැනටමත් වලංගුව පවතින ක්‍රියාකාරී අවසර පත්‍ර යටතේ හිමිවන නව ගෙවීම් වාරික මුදල් පිළිබඳව සහ එම වාරික වැඩ කොටස් නියමිත කාලය තුල නිමකිරීමේ අවශ්‍යතාවය පිළිබඳවත් ලිඛිතවම අවසර පත්‍ර හිමියන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

තවද, හැකි සෑම අවස්ථාවකදීම අවසර පත්‍ර යටතේ හිමි මුදලින් එම අවසර පත්‍ර හිමියන්ගේ එකඟතාවය මත වගා ද්‍රව්‍ය ලබාදීමේ වැඩ පිළිවෙලක් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න.

(6). තේ නැවත වගාව සහ පාළු සැපයීම යටතේ ගෙවනු ලබන දිරි දීමනා මුදල සංශෝධනය කිරීම පිණිස නිකුත් කරන ලද 1998.08.06 දැනැති වගා ආධාර චක්‍රලේඛ අංක 50 හි සඳහන් ගෙවීම් ප්‍රමාණයන් වෙනුවට මෙම චක්‍රලේඛයේ සඳහන් ගෙවීම් ප්‍රමාණයන් ආදේශ විය යුතු බැව් සැලකිය යුතුය.

(7). මෙම චක්‍රලේඛය ලද බවත් ඒ අනුව ක්‍රියා කරන බවත් නොපමාව සනාථ කළ යුතුය.

යතාපති

පිටපත් :

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන/ව්‍යාප්ති/මුදල්)
2. සහකාර සාමාන්‍යාධිකාරී (සංවර්ධන/පරිපාලන)
3. අභ්‍යන්තර විගණක
4. මුදල් කළමනාකරු
5. කෘෂි අර්ථශාස්ත්‍රඥ
6. සියලුම අධීක්ෂණ තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන්